# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
# මිහින්තලේ

## උපකුලපති තනතුර සඳහා අයදුම්පත්/නාම යෝජනා කැඳවීම

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් 34(I) වන වගන්තියේ හා එහි පසුකාලීන සංශෝධිත නියමයන්ට ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් උපකුලපති තනතුර සඳහා පුද්ගලයන්ගෙන් අයදුම්පත්/නාමයෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත අනුව උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙක් වේ. ඔහු/ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන නිලධාරියා, අධ්‍යයන නිලධාරියා සහ ගණන් දීමේ නිලධාරියා ද වේ. ඔහු/ඇය නිල බලයෙන් පාලක සභාවේ සහ සනාතන සභාවේ සාමාජික සහ සභාපති ද වේ.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත හා එහි සංශෝධනවල විධිවිධාන අනුව උපකුලපතිවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ කලින් ධූරය අතහැර ගියහොත් හැර වසර තුනක කාලයක් එම තනතුර දරනු ලබන අතර ඔහු/ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වන තුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම, මෙහෙයවීම හා හඳුන්වා දීම, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හා විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් උපකුලපති වගකිව යුතු අතර ඔහු/ඇය ඒ සඳහා සැමවිටම අධ්‍යයන විශිෂ්ඨත්වය, පාරදෘෂ්‍ය භාවය, වගවීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල නායකත්ව මූලධර්ම පිළිපැදිය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා ඉහළ අධ්‍යයන ඉලක්ක සඵල කරගත් සාර්ථක පර්යේෂණ දර්ශකයක් සහිත නායකත්ව ලක්ෂණයන්ගෙන් හෙබි විවිධ පුද්ගල පාර්ශවයන් සමග ප්‍රශස්ත අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගත හැකි ප්‍රතිපත්තිමය ගැටළු සම්බන්ධ මනා අවබෝධයක් ඇති, තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ හැකි අයෙක් විය යුතුය.

(අපේක්ෂිත අයදුම්කරුවන්/නාමිකයන් වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා http://www.rjt.ac.lk/news/?cat=2 විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.)

උපකුලපති, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළ වැටුප් තලයේ තැබීමේ හිමිකම ලබන අතර අදාල මූලික වැටුපෙන් 15% සංග්‍රහ දීමනාවක්, සන්නිවේදන දීමනාවක්, ඉන්ධන දීමනාවක් ආදිය ලැබීමට සුදුසුකම් ලබයි. මීට අමතරව උපකුලපති නිළ නිවස හිමිය.

අයදුම්පත්‍රය/නාමයෝජනා පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

1. උපන්දිනය ඇතුළුව අයදුම්කරුගේ/නාමිකයාගේ (අදාල ලේඛන ඇතුලත්ව) සම්පූර්ණ ජීව දත්ත තොරතුරු (අයදුම්කරු/නාමිකයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.)

2. විශ්වවිද්‍යාලයේ දැක්ම පිළිබඳ තම පුද්ගලික ප්‍රකාශනයක් එහි සංවර්ධනය උදෙසා අයදුම්කරු/නාමිකයා උපකුලපති තනතුරට තෝරා ගත හොත් ඔහු/ඇය විසින් විශ්වවිද්‍යාලයේ ඉටු කිරීමට බලාපොරොත්තුවන මෙහෙවර පිළිබඳ ප්‍රකාශයක්

3. අයදුම්කරු/නාමිකයා දැනට උපකුලපති ධූරය හොබවන්නේ නම් හෝ මීට පෙර විශ්වවිද්‍යාලයේ එම ධූරය හොබවා ඇත්නම් එම නිල කාලය තුළ ඔහු/ඇය විසින් ඉටුකරන ලද කර්තව්‍යයන් විදහා දැක්වෙන වාර්තාවක්

4. නාම යෝජනාවක් නම් නාමිකයාගේ කැමැත්ත සහිත ලිපියක්.

5. අයදුම්කරු/නාමිකයා රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේනම් ඔහු/ඇය තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් ඔහු/ඇය නිදහස් කළ හැකි බවට කැමැත්ත ප්‍රකාශ වූ සේවා යෝජකයාගෙන් ලිපියක්.

6. 2020.05.04 වන දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2020 හි නිර්දේශිත පිළිගත් ක්‍රියාමාර්ගයන්ට අනුව අපේක්ෂකයන් තිදෙනෙකුගේ නම් විශේෂ පාලක සභාව විසින් නිර්දේශ කර පාලක සභා රැස්වීම් වාර්තාව සමග පත් කිරීම සඳහා සලකා බැලීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

අයදුම්පත් හෝ නාමයෝජනා 2021.05.19 දින ප.ව. 2.30 ට පෙර **"ලේඛකාධිකාරී/පාලක සභාවේ ලේකම්, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ බාර දීම කළ හැකි ය.

අයදුම්පත්/නාමයෝජනා බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "උප කුලපති තනතුර සඳහා අයදුම්පත්‍රය" යන්න සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඒ.එම්.ජී.බී. අබේසිංහ
ලේඛකාධිකාරී/පාලක සභා ලේකම්
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.
2021.04.18